2016

වාර්ෂික වාර්තාව

ஆண்டு அறிக்கை

Annual Report



CMYK

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

இலங்கை அச்சுக நிறுவகம்

திறன் அபிவிருத்தி மற்றும் தொழிற்பயிற்சி அமைச்சு

SRI LANKA INSTITUTE OF PRINTING

Ministry of Skills Development & Vocational Training

වාර්ෂික වාර්තාව

2016

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

(1984 පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කරන ලදී)

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 08.

දුරකථන : 011 2686162, 011 2679791
ෆැක්ස් : 011 2686162
ඊ මේල් : sliopreg@sltnet.lk
වෙබ් අඩවිය : www.sliop.edu.lk

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

නම	ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
ස්ථාපනය	1984 අංක 18 දරණ පාර්ලිමේන්තු ආඥා පනත අනුව පිහිටුවා ඇත. 1985 අංක 16 දරණ දේශීය ආදායම් සංශෝධන පනත අනුව ආදායම් බදුවලින් නිදහස් කොට ඇත.
ලිපිනය	නො. 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
දුරකථනය	0112686162, 0112679791
ෆැක්ස්	0112686162
ලියාපදිංචි කාර්යාලය	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව නො. 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.
බැංකු	මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා බැංකුව.
විගණනය	1. ඩී. එච්. පී. මුණවීර සහ සමාගම 2. විගණකාධිපති දෙපාර්තමේන්තුව

පටුන

		පිටුව
1.	හැඳින්වීම	01
2.	ආයතනික උපක්‍රම හා කාර්ය භාරයන්	02
3.	ආයතනයේ අරමුණු	02
4.	ආයතනයේ ශක්තිය	02
5.	දැක්ම සහ ආකල්ප	04
6.	පාලන අධිකාරිය	06
7.	කාර්ය මණ්ඩලය	06
8.	ආයතනික ව්‍යුහය	07
9.	කථිකාචාර්ය මඩුල්ල	08
10.	ශාඛාවන්	10
11.	පුහුණු පාඨමාලා	11
12.	වැඩමුලු සහ සම්මන්ත්‍රණ	12
13.	වෘත්තීය සංවර්ධන මාර්ගය	13
14.	ශිෂ්‍ය දත්ත	14
15.	මූල්‍ය දත්ත	15
16.	වාර්ෂික ගිණුම් වාර්තාව	16
17.	විගණකාධිපති වාර්තාව සහ ආයතනික පැහැදිලි කිරීම	17
18.	මධ්‍ය කාලීන ක්‍රියා මාර්ග	18

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තයේ ප්‍රථම වෘත්තීය සන්ධානය වූ මෙම ආයතනය, එම ක්ෂේත්‍රයට අදාල දැනුම, හැකියා, දක්ෂතා සහ විශේෂඥතා ඥානය ප්‍රවර්ධනය කිරීම සඳහා මුළුමනින්ම කැපවී කටයුතු කරන අතර එහි ආරම්භක මූලික අරමුණු සාක්ෂාත් කරගැනීමෙහිලා නිරන්තරව යෙදී සිටී.

වර්ෂ 1984 දී පාර්ලිමේන්තු ආඥා පනතක් මගින් මෙම ආයතනය ප්‍රවෘත්ති හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදී. එය මුද්‍රණ කර්මාන්තයට අදාල විද්‍යා සහ කාර්මික අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහාත්, එම කාර්මිකයින්ගේ හැකියාවන් ඔප් නැංවීම සඳහාත් නොකඩවා පුළුල් වන ශිල්පීය ක්‍රම සහ දැනුම ප්‍රවර්ධනය කිරීම සඳහාත් දියත් කළ ලාභ නොලබන සංවිධානයකි. එහෙයින් මෙම ආයතනයේ මූලික කාර්යභාරය වනුයේ රටෙහි සමාජ - ආර්ථික වර්ධනයට සරිලනසේ මෙම කර්මාන්තයේ නවීකරණයට අවශ්‍ය සහය ලබාදීමය.

ආයතනික උපක්‍රම සහ කාර්යය භාරයන්:

වෙළඳ සහ වාණිජ ක්ෂේත්‍රයේ ශීඝ්‍රයෙන් පුළුල් වන්නා වූ තරඟකාරී පසුබිමක් තුල මුද්‍රණ සහ ගැෆික්ස් කර්මාන්තයේ දිනෙන් දින වර්ධනය වන නවීන තාක්ෂණය සහ කළමනාකරණ අවශ්‍යතාවයන් අනුව ශිල්ප ක්‍රමය දැනුම සහ හැකියා වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ස්වකීය උපක්‍රම සහ කාර්ය භාරයන් නැවත සකස් කිරීමේ, ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක මෙන්ම අදාල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහිද නිරතව සිටී.

ආයතනයේ අරමුණු:

- ශ්‍රී ලංකාවේ මුද්‍රණ ව්‍යාපාරයේ ප්‍රමිතිය නගා සිටුවීම සඳහා පවත්නා ශිල්පීය ක්‍රම, අමුද්‍රව්‍ය භාවිතයට සැලසුම් කිරීම වැනි විෂයන් පිළිබඳ මුද්‍රණ ක්ෂේත්‍රයේ සේවකයන් පුහුණු කිරීම.

- මුද්‍රණ තාක්ෂණය හා කළමණාකරණය පිළිබඳව පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.

- ආයතනය මගින් මෙහෙයවනු ලබන පුහුණු පාඨමාලා සඳහා සහතික සහ ඩිප්ලෝමා පිරිනැමීම.

- මුද්‍රණ ව්‍යාපාරයට අදාල නව විෂයමාලා සහ ශිල්පීය ක්‍රම පිළිබඳව සහ පවත්නා පාඨමාලා පිළිබඳව තොරතුරු සකස් කර පත්‍රිකා සහ වෙනත් වාරික ප්‍රකාශන මගින් සැපයීම සහ බෙදාහැරීම.

- විදේශීය මුද්‍රණ පාසැල් හෝ මුද්‍රණාලයන්හි පුහුණුව සඳහා දේශීය සිසුන්ට අනුග්‍රහය ලබාදීම සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් මගින් විදේශීය සිසුන්ට එම පහසුකම් මෙහි ලබාදීම.

- මෙරට මුද්‍රණ කර්මාන්තයේ උන්නතිය සඳහා මුද්‍රණ ව්‍යාපාරයේ නවීනතම ශිල්පීය ක්‍රමවේද සහ තොරතුරු ලබාගැනීම සඳහා විදේශීය වෙළඳ ප්‍රදර්ශන වලට සහභාගිවීම.

ආයතන ශක්තිය:

වසර 15 කට අධික කාලයක් ඔස්සේ පුහුණු ආයතනයක් වශයෙන් මුද්‍රණ කර්මාන්තයට අදාල මූලික කටයුතු පිළිබඳව නිපුණත්වයක් ලබා ඇත්තා වූ මෙම ආයතනය, දැන් මෙම ක්ෂේත්‍රයේ ප්‍රධානතම ශිල්ප ආයතනය බවට පත්ව ඇති මෙම කර්මාන්තයේ සෑම අංශයක්ම ආවරණය වනසේ මැනවින් සකස් කළ ගැඹුරින් හැදෑරිය හැකි පුහුණු පාඨමාලාවන් සපයන මෙම ආයතනය උසස් මට්ටමේ පරිගණක ඒකකයකින් සහ යන්ත්‍රෝපකරණ වලින්ද සමන්විතය. එමගින් අභ්‍යාසලාභීන්ට ඒවා පරිහරණය කිරීම පිළිබඳව මනා අවබෝධයක් සහ පුහුණුවක් ලබා ගතහැක. එමෙන්ම මෙහි වඩාත්ම කැපී පෙනෙන ලක්ෂණය වනුයේ තමන් සතු වඩාත් නවීනතම විශේෂඥ දැනුම නිතිපතා ලබාදෙමින් නොකඩවා අභ්‍යාසලාභීනට මග පෙන්වන එම ආයතනයට අනුබද්ධව කටයුතු කරන ඉතා පළපුරුදු සහ වෘත්තීය සුදුසුකම් ඇත්තා වූ උපදේශකවරු සහ කථිකාචාර්යවරුන්ගෙන් සමන්විත ගුරු මඩුල්ල වේ.

මෙම ආයතනයේ කාර්යක්ෂමතාවය සහ ප්‍රතිඵල තක්සේරු කලහැකි මිණුම් දණ්ඩ වනුයේ මෙහි පාඨමාලා හදාරා විශිෂ්ඨ දියුණුව ලැබූ ව්‍යාපාරිකයින්ගේ සාර්ථකත්වය, දැනට මෙහි පාඨමාලා හදාරණ අභ්‍යාසලාභීන්ගේ උද්‍යෝගය, උනන්දුව සහ මෙහි පුහුණුව ලැබීම සඳහා ඇතුලත්වීමට අයදුම්කරුවන් අතර ඇත්තා වූ මහත් තරඟයද වේ.

වසර ගණනාවක් අප රටේ පැවති සංවෘත ආර්ථිකය යටතේ දක්ෂතා වර්ධනය සඳහා තිබූ ඉඩ ප්‍රස්ථා සීමාසහිත වූ බැවින් මෙම ක්ෂේත්‍රය තුල යටපත්ව තිබූ ජාත්‍යන්තර මට්ටමේ තරඟකාරීත්වයට අවශ්‍ය කාර්මික ශිල්ප කළමණාකරණ ශක්තිය සහ වෘත්තීය දක්ෂතා වර්ධනය කිරීම සඳහා මෙම ආයතනය මහත් රුකුලක් වශයෙන් ආරම්භයේදී පිළිගනු ලැබීය.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් විවිධ අංශයන්හි විශේෂ දැනුම සහ පුහුණුව ලබාදීම සඳහා පාඨමාලා කිහිපයක් සකස් කර ඇති අතර එමගින් මුද්‍රණ කළමණාකරණය පිළිබඳ පිළිගත් ඩිප්ලෝමාවක් දක්වා හැදෑරිය හැකිය.

SLIOP යනුවෙන් කෙටියෙන් හැඳින්වෙන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය අනුමත පුණ්‍යායතනයකි. එබැවින් එය වෙත දෙනු ලබන පරිත්‍යාග අයබදු ගෙවීමෙන් නිදහස් කර ඇත. ලාභ නොලබන සංවිධානයක් වන මෙය එහි දියුණුව සහ අරමුණු ව්‍යාප්ත කිරීම සඳහා මෙම කර්මාන්තයේ නිරත ව්‍යාපාරික ප්‍රජාවන්ගෙන් සහ හිතවතුන්ගෙන් සහාය අපේක්ෂා කරන්නීය.

මේ සම්බන්ධයෙන් මේ දක්වා අපට ආධාර කළ HEIDELBERG, DRUCK MACHINE AG, AGFA GEVAERT, APPLE MACINTOSH යන සංවිධාන ඇතුලු සෙසු අයට අපගේ ඉමහත් ප්‍රසාදය පුද වේ. තවද අපගේ වත්මන් සේවාවන් වඩාත් දියුණු කිරීම සඳහා නූතන යන්ත්‍රෝපකරණ අවශ්‍යව ඇති බැවින් ඒවා ලබාගැනීමට ඔබගේ පූර්ණ සහය ගෞරවයෙන් අපේක්ෂා කරන්නෙමු.

මෙම ක්ෂේත්‍රයේ විවිධ අංශයන් පිළිබඳව මෙහි දෙනු ලබන පුහුණුව තුළින් ලබාගන්නා වූ දැනුම එම ක්ෂේත්‍රයේ රැකියාවන් වලට අත්වැලක් වනු ඇත. මෙම ආයතනයෙන් සපයනු ලබන දැනුම සහ උසස් තාක්ෂණය තුලින් මුද්‍රණ කර්මාන්තයේ නිරත අයහට තම දේශීය මුද්‍රණ කටයුතු ප්‍රමිතියෙන් සහ තත්ත්වයෙන් ඉතා උසස් මට්ටමකට ගෙන ඒමට හැකිවනු ඇත.

අභ්‍යාසලාභීන්ගේ දැනුම සහ හැකියාවන් දියුණු කිරීම සඳහා මෙම ආයතනයට වෘත්තීය මුද්‍රණ ශිල්පීන් ගණනාවකගේ සේවය ලබාගැනීමට හැකිවීම භාග්‍යයකි. මෙහි පාඨමාලාවන් සහ විෂය මාලාවන් පිළියෙල කිරීමද, අධ්‍යයන සැසිවාර මෙහෙයවීම සඳහා ද ඔවුන් සෘජුව සහභාගි වීම නිසා මෙම ආයතනයේ විවිධ අංශයන් බලාපොරොත්තු වන මට්ටමේ උසස් තත්ත්වයක පවත්වාගෙන යාමට හැකි වී තිබේ.

මුද්‍රණ ශිල්පයට අදාලව ඉතා උසස් තලයේ පුස්තකාලයක් ද මෙම ආයතනය සතුව ඇත. එමගින් න්‍යායික සහ ප්‍රායෝගික දැනුම ඉතා ගැඹුරින් හැදෑරීම සඳහා අභ්‍යාසලාභීන්ට අවස්ථාව ලැබී ඇත.

දැක්ම සහ ආකල්ප

පොදුවේ (හැඳින්වීම)

සෑම මානව ක්‍රියාකාරකමක් සඳහාම මුද්‍රණ කලාව පදනම් වී ඇති බව පැවසුවහොත් එය ඉතා නිවැරදිය. එසේම, මෙම ක්ෂේත්‍රය සෑමවිටම වෙනස්වන තොරතුරු තාක්ෂණය සමඟ තාක්ෂණිකමය වෙනස්වීම් වලට භාජනය වෙමින්, වර්තමානයේ සහ අනාගතයේ පවත්නා ඉල්ලුම සඳහා විශාල දියුණුවක් කරා ගමන් කරමින් තිබේ. තවද මෙම ක්ෂේත්‍රය තුළ වේගවත්ව සිදුවන ශිල්පීය ක්‍රමවේදයන්ගේ වෙස්වීම්, වඩා වැදගත් වන්නේ, ඊට අනුකූලව ජාත්‍යන්තර වෙළඳපොලේ ඉල්ලුමට ගැලපෙන පරිදි, රට තුළ වෙළඳ සහ කාර්මික පදනම නැවත සකස්වීමේ ක්‍රියාවලියක සිටින බැවිනි. එසේම මෙම ආයතනය විසින්, ඇසුරුම්කරණය, මුද්‍රණ සහ ප්‍රමිතිකරණය යන ක්ෂේත්‍ර තුළ පවත්නා නව අභියෝග සහ අවශ්‍යතා බොහෝ දුරට හඳුනාගෙන තිබේ.

ජාතික නිෂ්පාදන ඵලදායිතාවෙන් සහ ප්‍රමිතියෙන් උසස් තත්ත්වයකට ගෙන ඒමේ රජයේ වැඩපිළිවෙලට ආධාරකයක් වශයෙන්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින්, කළමනාකරණ සහ අධීක්ෂණ නිලධාරීන් සඳහා කෙටිකාලීන පාඨමාලාවන් සකස්කර ක්‍රියාත්මක කරමින් පවතී. ඒ තුළින් ඔවුන්ගේ දැනුම සහ ශිල්පීය හැකියාව වර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. නිෂ්පාදන ඵලදායිතාව සහ ප්‍රමිතිය යන්න වෙන්කළ නොහැකි මූලධර්මයන් දෙකක් වේ.

තවද ආයෝජන ප්‍රවර්ධන කලාප පිහිටුවීම නිසා රට තුළට විදේශ ව්‍යවසායකයින් පැමිණීම, ඒ නිසා විදේශ ආයෝජන ගලා ඒම, නව තාක්ෂණික ශිල්පීය ඥානය සහ ව්‍යාපාරික ක්‍රමවේද භාවිතය, පෞද්ගලික අංශය දියුණු කිරීමට වැඩි අවධානයක් යොමු කිරීම වැනි කරුණු නිසා, මුද්‍රණ රටා ක්ෂේත්‍රයේ දියුණුවට මනා පිටුවහලක් ලැබී තිබේ. මේ අනුව පෙනී යන්නේ නව අභියෝගවලට සහ අවශ්‍යතාවන්ට, අප මුහුණ දෙන්නා වූ ස්වභාවය මත, මෙම කර්මාන්තයේ අඛණ්ඩ සාර්ථකත්වය රඳා පවතින බවය.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මේ ක්ෂේත්‍රයේ ඇති වී තිබෙන නව තාක්ෂණික දියුණුවත් සමඟම එහි පවත්නා සම්පත්වල සහ පුහුණු පාඨමාලාවල තත්ත්වය උසස් කිරීම සඳහා අඛණ්ඩ ක්‍රියාදමයක යෙදී සිටියි. තවද මෙම ආයතනය පාසැල් හැරගිය අයවළුන් සඳහා වෘත්තීය පුහුණු අධිකාරියේ මුද්‍රණ පාසල සමඟ එක්ව පවත්වනු ලබන CPtronic Heidlberg Printing Machine භාවිතය පිළිබඳ විශේෂ පාඨමාලාව සහ TWO Colour Stream Feeder Litho Machine Operations පුහුණු පාඨමාලාව, හේතුවෙන්, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා වැඩි වටිනාකමක් ලැබී තිබේ.

එසේම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය කොළඹ විශ්වවිද්‍යාලය හා එක්ව මුද්‍රණ තාක්ෂණ සහ කලමනාකරණය, දෘශ්‍ය සන්නිවේදනය සහ කළමනාකරණය යන උසස් ඩිප්ලෝමා පාඨමාලා දෙක පවත්වාගෙන යාමට හැකිවීම, මෙම ආයතනය ලැබූ විශාල ජයග්‍රහණයක් සේ සැලකිය හැක. තවද, කොළඹ විශ්වවිද්‍යාලයේ එම් පාඨමාලාව සඳහා, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ උසස් ඩිප්ලෝමාව හදරා තිබීම මූලික සුදුසුකමක් ලෙස සැලකීම, ආයතනය ලැබූ ඉහළ පිළිගැනීමකි.

ශ්‍රී ලංකාවේ මුද්‍රණ කර්මාන්තය හොඳින් ස්ථාපනය වෙමින් පවතින අතර, එමනිසා මුද්‍රණ තත්ත්වය ක්‍රමවත්ව දියුණු වීම අවශ්‍යය වේ. ඊට අමතරව වර්තමානයේ, විද්‍යුත් පෙර-මුද්‍රණ ක්‍රියාදාමයන් සමඟ මුද්‍රණ කර්මාන්තයේ ක්‍රියාකරකම් නවීකරණය වෙමින් පවතී. එසේම ශ්‍රී ලංකාව, මුද්‍රණයේ තත්ත්වය ආරක්ෂා කරගනිමින්, විද්ශීය තරඟවලට අතුළුවීම තුළ, ඒ මගින් ලබාගන්නාවූ අවබෝධය සහ විශේෂඥතාවය මුද්‍රණ කර්මාන්තයේ දියුණුව සඳහා වැදගත් වේ.

වර්තමානයේදී, ශ්‍රී ලංකාවේ මුද්‍රණ රටා ක්ෂේත්‍රයේ විවිධ අංශයන් ගැන උසස් අධ්‍යාපනයක් ලබා දිය හැකි එකම ආයතනය, ශ්‍රී.ලං.මු.ආ. වේ. එසේම මෙම ආයතනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ යන්ත්‍ර උපකරණ ලබාදෙන්නේ නම්, මෙම කර්මාන්තය සඳහා අවශ්‍ය කරන සියලු පුහුණු පාඨමාලාවන් පැවැත්විය හැකිය. ඊට අමතරව මෙම කර්මානත්යේ තාක්ෂණිකමය ඉල්ලුම සපුරාලීමට අවශ්‍යය කරන ශිල්පීය ඥනය සහ ශිලපීය ක්‍රම පිළිබඳව, මුද්‍රණකරුවන්ට අවශ්‍ය පුහුණුව හා උපදෙස් ලබාදීමටද හැකිවේ. එසේම ආයතනයේ ඉඩප්‍රමාණය හා සම්පත් අතින් තවත් වැඩි දියුණු වූ විට ආයතනිකමය පරීක්ෂණ, මුද්‍රණ කඩදසි, තීන්ත පරීක්ෂණ සහ ප්‍රමිතිකරණය වැනි අමතර සේවාවන්ද අවශ්‍යකරන පාර්ශ්ව වෙත ලබාදියහැකිය.

ආයතනය අලුත් නවාතැනකට

ඉහත සඳහන් සියලු කාරණා සැලකිල්ලට ගැනීමේදී ශ්‍රී ලංකාවේ මුද්‍රණ හා ග්‍රැෆික්ස් ක්ෂේත්‍රය පුළුල් වීම තුල, ශ්‍රී ලජකා මුද්‍රණ ආයතනයේ සේවාවන් තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා සියලු පහසුකම් සහිත තාක්ෂණික පුහුනු ආයතනයක් ගොඩනැගීම අවශ්‍ය වී ඇත. එසේම මුද්‍රණ ආයතනයේ ඇති අඩු ඉඩකඩ සහ පහසුකම් නිසා ඇතිවන බාධා පාලනාධිකාරිය විසින් හොඳින් හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා රජය සමඟ සියලු පහසුකම් සහිත පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමට මාර්ගය සකස් කරගෙන තිබේත

මේ සඳහා පර්චස් 40ක ඉඩමක්, රජයේ මුද්‍රණාල පරිශ්‍රයෙන් ලැබී ඇති අතර, එම පුහුණු මධ්‍යස්ථානය ගොඩනැගීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබාගැනීමට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය උත්සාහ ගනිමින් සිටී.


පාලන අධිකාරිය - ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ඩබ්. ඒ. ඒ. ජී. ෆොන්සේකා මහතා	-	රජයේ මුද්‍රණාලයාධිපති, - සභාපති
රවීන්ද්‍ර කලංසූරිය මහතා -	-	සභාපති රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව - සාමාජික
වී. කුමරන් මහතා - -	-	සභාපති ශ්‍රී ලංකා මුද්‍රණ කරුවන්ගේ සංගමය - සාමාජික
ජේ. ඩී. සී. පෙරේරා මහතා - -	-	සභාපති ශ්‍රී ලංකා ඇසුරුම්කරුවන්ගේ සංගමය - සාමාජික
ධර්මදාස ලියනගේ මහතා -	-	සාමාජික
ඩබ්. කේ. උපේන්ද්‍ර මහතා -	-	සාමාජික
පියල් රංජන් මහතා -	-	සාමාජික
නිමල් වලාකුළුආරච්චි මහතා -	-	සාමාජික

කාර්ය මණ්ඩලය - ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

සිසිර බරනගේ මහතා -	-	ලේඛකාධිකාරී/ප්‍රධාන විධායක නිළධාරී
එච්. කේ. බී. ඉන්ද්‍රකුමාර් මහතා -	-	අධ්‍යයන අධ්‍යක්ෂ
හිමාෂි ෆොන්සේකා මහත්මිය -	-	පාලන හා ගිණුම් සහකාර
චමල් හෙට්ටිආරච්චි මහතා -	-	සහකාර කථිකාචාර්ය
තනුජා දමයන්ති මහත්මිය -	-	සහකාර කථිකාචාර්ය
ආර්. ඒ. එම්. ප්‍රේමසිරි මහතා -	-	උපදේශක
යූ. එම්. සනත් මානගේ මහතා -	-	උපදේශක
සමන්ත කුළතුංග මහතා -	-	උපදේශක
ඩබ්. ඒ. එම්. ලංකාතිලක මහතා -	-	ලිපිකරු
ඊස්රාචාරී ඒඩින් මහතා -	-	කාර්යාල කාර්ය සහයක

පරිපාලන සැකිල්ල



අනුමත කාර්ය මණ්ඩලය

ලේඛකාධිකාරී	- 01
පාඨමාලා අධ්‍යක්ෂ	- 01
සහකාර කථිකාචාර්ය	- 01
උපදේශකවරු	- 07
ගිණුම් හාපරිපාලන නිලධාරී	- 01
ලිපිකරු	- 01
කර්යාල කාර්ය සහායක	- 01

වර්තමාන කාර්ය මණ්ඩලය

ලේඛකාධිකාරී	- 01
පාඨමාලා අධ්‍යක්ෂ	- 01
සහකාර කථිකාචාර්ය	- 01
උපදේශකවරු	- 05
ගිණුම් හාපරිපාලන නිලධාරී	- 01
ලිපිකරු	- 01
කර්යාල කාර්ය සහායක	- 01

බාහිර කථිකාචාර්ය මඩුල්ල

- ආචාර්ය ඒ. ඒ. සී. අබේසිංහ - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- එස්. බී. රණසිංහ මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- රුවනි චන්ද්‍රසේකර මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- චන්දන විජේකෝන් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ජී. එස්. පී. රන්දිවෙල මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ජී. ආර්. ටී. සිල්වා මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- එස්. සසිදරන් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ඒ. එච්. සී. පී. අතපත්තු මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ගුණපාල රණවීරගේ මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය සම්පත් කෙහෙල්වලතැන්න මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- නුරාදි ජයසිරි මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ඒ. ඩබ්. ජේ. සී. අබේගුණසේකර මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ගිම්හානි ඒකනායක මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- රොෂෙල් විමලසිංහ මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- කේ. ඩී. ජේ. සමන්ති මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- මහාචාර්ය එච්. සී. කරුණාරත්න - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- මහාචාර්ය පී. එස්. එම්. ගුණරත්න - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- කාංචනා විජයවර්ධන මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය රාජිත සිල්වා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය ආර්. සෙන්තිරාජා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය කේ. කජේන්ද්‍ර - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- ශානිකා ලක්මාලි මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- රුවංගි චන්ද්‍රසේකර මහත්මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කොළඹ විශ්වවිද්‍යාලය
- අශෝක නානායක්කාර මහතා - උපදේශක ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
- ගංගානි ලියනගේ මහත්මිය - නියෝජ්‍ය මුද්‍රණලාධිපති
- බී. පතිරණ මහතා - මුද්‍රණ කළමණාකරු,ප්‍රින්ට් කෙයාර් පුද්ගලික සමාගම
- රසන්ත චන්ද්‍රතිලක මහතා - නිෂ්පාදන කළමණාකරු රිවිර පුවත්පත් ආයතනය
- රෙව්. ඩී. බීලිං මහතා - නිර්මාණ උපදේශක

- ජගත් මදනායක මහතා - වෙළඳ කළමණාකරු, ඩී. අයි. සී. ලංකා පුද්ගලික සමාගම
- එම්. ඒ. ජස්ටින් මහතා - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කඩදාසි තාක්ෂණය
- සිසිර බරනගේ මහතා - ප්‍රධාන විධායක නිළධාරී ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
- එම්. ඩී. මහින්දපාල මහතා - උපදේශක සිනමාකරණය
- ස්ටැන්ලි හෙට්ටිආරච්චි මහතා - අධ්‍යක්ෂ වෘත්තීය හා තාක්ෂණික විශ්ව විද්‍යාලය කථිකාචාර්ය හා උපදේශක සිනමාකරණය
- ඔස්මන් ජයා මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ලේක්හවුස් ආයතනය
- රෝහන් පියරතන මහතා - උපදේශක ග්‍රැෆික් නිර්මාණකරණය
- ප්‍රසන්න ජයරත්න මහතා - උපදේශක ග්‍රැෆික් නිර්මාණකරණය
- ජේ. ජී. නයෝමි නිරංගා මෙනෙවිය - උපදේශක ග්‍රැෆික් නිර්මාණකරණය
- සුහසිංහ පෙරේරා මහතා - කථිකාචාර්ය පොත් මුද්‍රණය සහ නිමාව
- ජේ. ඒ. ඩී. ප්‍රේමතුංග මහතා - කථිකාචාර්ය පොත් බැඳුම්කරණය සහ නිමාව
- ඩබ්. එස්. ප්‍රියන්ත මහතා - කථිකාචාර්ය මුද්‍රණ පිරිවැයකරණය
- ධම්මික විමලරත්න මහතා - කථිකාචාර්ය මුද්‍රණ තාක්ෂණය
- නලින් විජේනායක මහතා - කථිකාචාර්ය වෙබ් අඩවි නිර්මාණකරණය හා MS Office
- ලක්මාල් පෙරේරා - කථිකාචාර්ය වෙබ් අඩවි නිර්මාණකරණය හා MS Office
- නීල් කුරේ - කථිකාචාර්ය ඩිජිටල් ඇනිමේෂන් තාක්ෂණය
- සිතාරි කුරේ මහත්මිය - කථිකාචාර්ය MS Office

ශාඛාවන්

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සතුව ශාඛාවක් මාතලේ පවත්වාගෙන යනු ලැබේ.

ලිපිනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මාතලේ
දුරකථන: 0662222172

මාතලේ ශාඛාවේ පවත්වනු ලබන පාඨමාලාවන් පහත දැක්වේ

1. පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම
2. පරිගණක මුද්‍රණ රටා
3. මයික්‍රොසොෆ්ට් ඔෆිස්
4. වෙබ් ඩිසයිනින්

පුහුණු පාඨමාලා

පාඨමාලාව	ගාස්තු	කාලය
පරිසණක ආශ්‍රිත අකුරු ඇමිණීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 12 850	පැය 120
පරිසණක ආශ්‍රිත මුද්‍රණ රටා නිර්මාණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	රු. 15 350	පැය 114
පිරිවැය හා ඇස්තමේන්තුකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 15 350	වසර 01
ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 15 350	වසර 01
ආංකික පෙර මුද්‍රණ පාඨමාලාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 19 850	වසර 01
පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 15 350	සති 26
මුද්‍රණ රටා පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 12 350	වසර 01
වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 15 350	සති 20
ඕෆසෙට් ලිතෝකරණය පිළිබඳ පූර්ණ කාලීන සහතිකපත්‍ර පාඨමාලාව	රු. 20 850	සති 56
අරේකීය සංස්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 20 850	සති 16
ආංකීය සජීවීකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 20 850	සති 24
පරිසණක එකලස් කිරීමේ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 11 850	සති 14
මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 10 850	සති 20
පොත් බැඳුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	රු. 15 850	සති 28
ග්‍රැෆික් ඩිසයින් ඩිප්ලෝමා පාඨමාලාව	රු. 29 350	වසර 01
මුද්‍රණ සැලසුම්කරණය හා මුද්‍රණ තැටි සෑදීම	රු. 9 350	සති 12
මුද්‍රණ තාක්ෂණය හා කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව	රු. 120 000	වසර 02
දෘශ්‍ය සන්නිවේදනය හා කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව	රු. 120 000	වසර 02

2016 වසරේ පැවැත්වූ වැඩමුළු හා සම්මන්ත්‍රණ


නොමිලේ පැවැත්වූ සම්මන්ත්‍රණ හා වැඩමුළු

සම්මන්ත්‍රණය	දිනය	සහභාගීත්වය
1. පරිගණක මුද්‍රණ රටා	2016.01.24	46
2. පරිගණක මුද්‍රණ රටා සහ මල්ටිමීඩියා	2016.03.29	27
3. පරිගණක මුද්‍රණ රටා	2016.05.24	08
4. පරිගණක මුද්‍රණ රටා සහ මල්ටිමීඩියා	2016.06.21	35

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

(1984 අංක 18 දරන පාර්ලිමේන්තු පනතකින් ස්ථාපනය කරන ලද්දකි)

CAREER DEVELOPMENT PATH



ශිෂ්‍ය දත්ත

පාඨමාලාව	ඉලක්ක සිසුන් ගණන	තත්‍ය සිසුන් ගණන
පරිසණක ආශ්‍රිත මුද්‍රණ රටා නිර්මාණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	130	83
පිරිවැය හා ඇස්තමේන්තුකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	20	40
ඕෆ්සෙට් ලිතෝකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	20	-
ආංකික පෙර මුද්‍රණ පාඨමාලාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	10	29
පරිසණක ආශ්‍රිත අකුරු ඇමිණීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	240	331
පත් ලිතෝ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	25	-
මුද්‍රණ රටා පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	25	-
වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	30	28
ඕෆසෙට් ලිතෝකරණය පිළිබඳ පූර්ණ කාලීන සහතිකපත්‍ර පාඨමාලාව	40	39
අරේකීය සංස්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	10	21
ආංකීය සජීවීකරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	10	21
පරිසණක එකලස් කිරීමේ සහතිකපත්‍ර පාඨමාලාව	10 -	12
මයික්‍රොසොෆ්ට් ඔෆිස් පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	40	132
පොත් බැඳුම්කරණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව	30	32
ග්‍රැෆික් ඩිසයින් ඩිප්ලෝමා පාඨමාලාව	60	67
මුද්‍රණ සැලසුම්කරණය හා මුද්‍රණ තැටි සෑදීම	8	-
මුද්‍රණ තාක්ෂණය හා කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව	10	පාඨමාලා පැවැත්වේ.
දෘශ්‍ය සන්නිවේදනය හා කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව	15	පාඨමාලා පැවැත්වේ.

මූල්‍ය දත්ත

ප්‍රධාන කාර්යාලය :-	ඇස්තමේන්තු ගත ආදායම වියදම	තථ්‍ය ආදායම සහ වියදම
මෙහෙයුම් ආදායම	14,373,000.00	21,506,489.00
මෙහෙයුම් නොවන ආදායම්	3,677,661.00	5,175,878.00
ආදායම් වල එකතුව	18,050,661.00	26,682,467.00
වියදම්	13,578,058.00	19,053,926.00
මෙහෙයුම් ලාභ / අලාභ	794,942.00	2,452,563.00
ලාභය / අලාභය	4,472,603.00	7,628,441.00
මාතලේ ශාඛාව :-		
ආදායම	600,000.00	664,000.00
වියදම	517,775.00	581,526.00
ලාභය / අලාභය	82,255.00	82,474.00

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

2016.12.31 දිනෙන්
අවසන් වසර සඳහා ගිණුම් වාර්තා

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 8.
මූල්‍ය තත්ව ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනට	සටහන්	2016 රු.	2015 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	1	4,499,853.92	5,662,770
අස්පෘෂ්‍ය වත්කම්	2	111,187.50	144,500
මුළු ජංගම නොවන වත්කම්		**4,611,041.42**	**5,807,270**
ජංගම වත්කම්			
වෙළඳ හා අනෙකුත් ලැබීම්	3	6,373,935.13	4,826,224
කලින් කල ගෙවීම්	4	9,540.05	5,163
කෙටිකාලීන ආයෝජන	5	70,075,365.07	62,923,560
මුදල් හා මුදල් වලට සමාන දෑ	6	3,069,153.42	2,595,621
මුළු ජංගම වත්කම්		**79,527,993.67**	**70,350,568**
මුළු වත්කම්		**84,139,035.09**	**76,157,838**
අරමුදල් සහ වගකීම්			
අරමුදල්			
සමුච්චිත අරමුදල	7	81,614,880.27	73,986,438
මුළු අරමුදල්		**81,614,880.27**	**73,986,438**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික වෙන්කිරීම්	8	1,109,523.75	1,012,550
මුළු ජංගම නොවන වගකීම්		**1,109,523.75**	**1,012,550**
ජංගම වගකීම්			
වෙළඳ හා අනෙකුත් ගෙවීම්	9	1,414,631.07	1,158,849
මුළු ජංගම වගකීම්		**1,414,631.07**	**1,158,849**
මුළු අරමුදල් සහ වගකීම්		**84,139,035.09**	**76,157,838**

.....
ගණකාධිකාරී

ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂක මණ්ඩලයේ වගකීම වේ.
අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අත්සන් කරනුයේ,

.....
සභාපති

.....
අධ්‍යක්ෂක

2017.04.03

මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 16 දක්වා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 8.
විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන්	2016 රු.	2015 රු.
පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්	10	21,401,698.00	20,002,193
මාතලේ ශාඛාවෙන් ලද ශුද්ධ අතිරික්තය/(ඌණතාවය)	11	82,473.14	8,665
පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් මත සෘජු වියදම්	12	(8,081,770.93)	(8,903,580)
සේවක වියදම් හා මෙහෙයුම් පිරිවැයට පෙර ආදායම		**13,402,400.21**	**11,107,278**
අනෙකුත් ආදායම්	13	22,317.61	166,258
මෙහෙයුම් ආදායම		**13,424,717.82**	**11,273,536**
මෙහෙයුම් වියදම්			
සේවක වියදම්	14	(4,798,518.95)	(2,974,246)
දේපළ හා උපකරණ ක්ෂය		(1,798,959.59)	(1,604,849)
අනෙකුත් මෙහෙයුම් වියදම්	15	(4,374,676.12)	(3,438,122)
මුළු මෙහෙයුම් වියදම්වල එකතුව		**(10,972,154.66)**	**(8,017,217)**
ශුද්ධ මෙහෙයුම් ආදායම		**2,452,563.17**	**3,256,319**
ශුද්ධ මූල්‍ය ආදායම	16	5,175,878.79	3,881,638
වර්ෂයේ අතිරික්තය		**7,628,441.96**	**7,137,957**
අනෙකුත් විස්තරාත්මක ආදායම්		-	-
වර්ෂයට අදාල විස්තරාත්මක ආදායම සමුච්චිත අරමුදලට මාරු කිරීම		**7,628,441.96**	**7,137,957**

මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 16 දක්වා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 8.
සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය

	සමුච්චිත අරමුදල රු.	එකතුව රු.
2015/01/01 දිනට ශේෂය	**66,848,481.71**	**66,848,481.71**
වසරේ අතිරික්තය	7,137,956.60	7,137,956.60
2015/12/31 දිනට ශේෂය	**73,986,438.31**	**73,986,438.31**
වසරේ අතිරික්තය	7,628,441.96	7,628,441.96
2016/12/31 දිනට ශේෂය	**81,614,880.27**	**81,614,880.27**

මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 16 දක්වා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
නො. 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත කොළඹ 8.
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2016	2015
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		
වියදමට වැඩි ආදායම	7,628,442	7,137,957
ගැලපීම්		
ක්ෂයවීම්	1,800,405	1,606,294
පාරිතෝෂික වෙන්කිරීම්	96,974	91,940
අපහායනය සඳහා වෙන්කිරීම්	-	1,092,025
වත්කම් ඉවත්කිරීමෙන් වූ අලාභය	(12,862)	(123,412)
පොළී ලැබීම්	(5,151,809)	(3,854,936)
ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	**4,361,149**	**5,949,867**
වත්කම්වල (වැඩිවීම්) /අඩුවීම්	(1,552,089)	(2,314,849)
වගකීම්වල (අඩුවීම්) / වැඩිවීම්	255,782	(1,627,319)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,064,843**	**2,007,699**
පාරිතෝෂික ගෙවීම්	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,064,843**	**2,007,699**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
පොළී ලැබීම්	4,177,056	2,022,838
දේපල, පිරියත හා උපකරණ විකිණීම	14,840	135,681
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම	(606,155)	(2,243,117)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**3,585,741**	**(84,598)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	-	-
මුදල් හා මුදල් වලට සමාන දෑ වලට සිදු වූ ශුද්ධ බලපෑම	6,650,584	1,923,101
පසුගිය වසරේ මුදල් හා මුදල් වලට සමාන දෑ	63,043,231	61,120,131
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ	**69,693,815**	**63,043,231**
මුදල් හා මුදල් වලට සමාන දෑ		
බැංකු හා මුදල්	3,063,780	2,590,248
කෙටිකාලීන ආයෝජන	66,624,661	60,447,609
අතැති මුදල්	5,373	5,373
වර්ෂය අවසානයේ මුදල් හා මුදල් වලට සමාන දෑ	**69,693,815**	**63,043,231**

මෙම මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ වැදගත් වන ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 5 සිට 16 දක්වා ඇත.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය
මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1. ආයතනික තොරතුරු

1.1 පොදු

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය 1984 වර්ෂයේදී අංක 18 දරණ මුද්‍රණ ආයතන පනත යටතේ පිහිටුවා ඇත. ආයතනයේ ලියාපදංචි කාර්යාලය අංක 118, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 8 යන ලිපිනයෙහි පිහටා ඇත.

1.2 මූලික කටයුතු හා මෙහෙයුම්වල ස්වාභවය

2012 වර්ෂයේදී මුද්‍රණ ආයතනය පහත සඳහන් කටයුතුවල යෙදී ඇත.

අ. මුද්‍රණ කටයුතු පිළිබඳ පාඨමාලා පැවැත්වීම

ආ. මුද්‍රණ කර්මාන්තයේ අළුත් තාක්ෂණ ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළු පැවැත්වීම.

ඇ. මුද්‍රණ කටයුතු පිළිබඳ උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම

ඈ. මුද්‍රණ කර්මාන්තයේ රැකියා සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.

2. වැදගත් වන ගිණුම්කරණ ප්‍රමිතීන්

2.1 ගිණුම් පිළියෙල කිරීමේ පදනම

මුද්‍රණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත්කර තිබේ.

මුද්‍රණ ආයතනයේ මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී මුල්‍ය වත්කම් හා වගකීම් සාධාරණ අගය මත ගිණුම් ගත කිරීම හැර ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

2.2 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශය

මුද්‍රණ ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් පනවා ඇති සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇත.

2.3 භාවිතා කරන ලද වැදගත් ගිණුම්කරණ විනිශ්චයන් ඇස්තමේන්තු සහ උපකල්පන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනාගතයට අදාල වන ඉතා වැදගත් සමහර ගිණුම්කරණ උපකල්පන භාවිතා කිරීමට සිදුවේ. ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදා ගැනීමේදි කළමනාකාරිත්වය විසින් පහත සඳහන් වැදගත් ගිණුම්කරණ විනිශ්චයක්, ඇස්තමේන්තු සහ උපකල්පන යොදා ගෙන ඇත.

අඛන්ඩ පැවැත්ම

සැලකිය යුතු අනාගත කාලයක් සඳහා මුද්‍රණ ආයතනය පවත්වාගෙන යාමට හැකි බවට කළමණාකාරිත්වය තක්සේරු කර ඇත. තවදුරටත් අඛන්ඩ පැවැත්ම පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සැලකිය යුතු අනුමානයන් යොමු කල හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පිළිබඳ කළමනාකාරිත්වය නොදැන සිටින බවත් සහ මෙහෙයුම් කටයුතු ඈවර කිරීමට හෝ අවසන් කිරීමට ඔවුන්ට අදහසක් නැමැති බවය.

මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් සාධාරණ අගය මත දක්වා ඇත. සාධාරණ අගය තීරණය කිරීමට වෙළඳපොළ මිල ගණන් සොයා ගත නොහැකි විට ඒ සඳහා අනෙකුත් අගය කිරීම් ක්‍රම උපයෝගී කර ගනී.

2.4 මූල්‍ය උපකරණ ආරම්භක හඳුනා ගැනීම සහ පසු අගය කිරීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 11,12 සහ 11.41 ට අයත් විෂය පථය යටතේ මූල්‍ය උපකරණ වර්ග කර ඇත. මූල්‍ය වත්කමක ආරම්භය හඳුනාගැනීමේදී මුද්‍රණ ආයතනය වර්ගීකරණය කරනු ලබයි.

2.4.1 හඳුනා ගැනීමේ දිනය

සියළුම මූල්‍ය වත්කම් හා වගකීම් ගනුදෙනුව සිදු වූ දිනයේදී හඳුනා ගැනේ.

2.4.2 මූල්‍ය උපකරණවල ආරම්භක අගය කිරීම

ආරම්භක හඳුනාගැනීමේදී මූල්‍ය උපකරණ වර්ග කිරීම එවායේ පරමාර්ථය, ගති ලක්ෂණ සහ ඒවා අත්පත් කර ගැනීමේදී කළමනාකරුවන්ගේ අභිප්‍රාය මත රඳ පවති.

2.4.3 මූල්‍ය උපකරණ වල පසු අගය කිරීම

මුද්‍රණ ආයතනය මුල් අගය කිරීමෙන් පසුව සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම මූල්‍ය උපකරණ වල ගනු දෙනු මිල හා සාධාරණ අගයෙහි වෙනසස්වීම් හඳුනා ගනී.

2.5 මූල්‍ය උපකරණ හඳුනා නොගැනීම

2.5.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමක් (මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් වල කොටසක් යම් තැනක අදාළ වන පරිදි) පහත සඳහන් අවස්ථාවල හඳුනා නොගනී.

- වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය අවසන් වී තිබීම
- මුද්‍රණ ආයතනය විසින් වත්කමකින් මුදල් ප්‍රවාහ ලැබීමට ඇති අයිතිය මාරු කර තිබීම.

2.5.2 මූල්‍ය වගකීම්

වගකීම් යටතේ වන බැඳීම් නිදහස් වූ විට හෝ අහෝසි වූ විට හෝ කාලය ඉකුත් වූ අවස්ථාවක මූල්‍ය වගකීම් හඳුනා නොගනු ලැබේ. තිබෙන මූල්‍ය වගකීමක් එම ණය හිමියාගේම වෙනත් මූල්‍ය වගකීමකින් සැලකිය යුතු වෙනත් කොන්දේසි යටතේ හෝ දැනට තිබෙන වගකීම්වල කොන්දේසි සැලකිය යුතු සංශෝධනය වීමක් යටතේ, ප්‍රතිෂ්ඨාපනය වූ අවස්ථාවක, එවැනි හුවමාරුවක් හෝ සංශෝධනයක් මුල් වගකීම හඳුනා නොගැනීමක් ලෙසත් සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙසත් සලකනු ලැබේ. මුල් මූල්‍ය වගකීමේ ධාරණ අගය සහ ගෙවන ලද ප්‍රතිෂ්ඨාව අතර වෙනස ලාභ හෝ අලාභ වල හඳුනා ගනු ලැබේ.

2.5.6 මූල්‍ය වත්කම්වල අපහායනය

සෑම වාර්තාකරණ දිනයකදීම මුද්‍රණ ආයතනය විසින් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් අපහායනයට ලක් වී ඇති බවට විෂයානුබද්ධ සාක්ෂි ඇති බවට සලකනු ලබන්නේ වත්කමක ආරම්භක හඳුනා ගැනීමෙන් පසු සිදු වී තිබෙන සිද්ධීන් එකක් හෝ කිහිපයක ප්‍රතිඵලයන් වශයෙන් (දරන ලද අලාභ සිද්ධියක්) අපහායනයට අදාළ විෂයානුබද්ධ සාක්ෂි ඇත්නම් සහ විශ්වාසවන්තව ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කම් වල සහ මූල්‍ය සමූහගත අනාගත මුදල් ප්‍රමාණවල බලපෑමක් කල හැකි අදාළ අලාභ සිද්ධිය (සිද්ධීන්) ඇති වී තිබෙන විටය.

2.6 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ දෛනික නඩත්තු වියදම් එකතු කිරීමක් නොමැතිව සමුච්චිත ක්ෂය වීම් සහ සමුච්චිත හානි වන අගය හීන වීම් අඩුකල පිරිවැය මත දැක්වේ.

වත්කමේ ඉතිරි ඵලදායී ජීවකාලය සහ අගය ක්ෂයවීම පිළිබඳ විධි ක්‍රම මූල්‍ය වර්ෂය අවසානයේදී විමර්ෂණය කරනු ලබයි. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ පිරිවැය මත සරල මාර්ග ක්ෂය ක්‍රමයටය. ක්ෂය වීමට අදාළ අනුපාත පහත දැක්වේ.

පරිගණක	අවුරුදු 3
යන්ත්‍ර හා අනෙකුත්	අවුරුදු 10

විකිණීමේදී හෝ දේපල,පිරියත හා උපකරණ භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ බලාපොරොත්තු නොවන අවස්ථාවක ඒවා හඳුනා නොගනු ලැබේ. එවැනි අවස්ථාවකදී සිදුවන ලාභ හෝ අලාභ (වත්කමේ වත්මන් අගය ලෙස ගෙන යන ප්‍රමාණය සහ එය විකිණීමේදී ලද ශුද්ධ ආදායම අතර ගණනය කරන ලද වෙනස) එකී වත්කම මුළුමනින්ම නොසලකා හරින ලද වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ වෙනත් මෙහෙයුම් ආදායම් තුල ඇතුලත් කරනු ලැබේ.

2.7 වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන්

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂයන් ගනුදෙනුව සිදුවූ මිලට හඳුනා ගනු ලැබේ. එම ශේෂයන් සළුලදායී පොළී අනුපාතය යටතේ පසුකාලීනව අගය කරනු ලැබේ.

2.8 රාජ්‍ය ප්‍රදාන

රාජ්‍ය ප්‍රදාන ලැබීමේ සියළු අවශ්‍යතා සපුරාලූ විට එම වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කරයි.

2.8 සේවක ප්‍රතිලාභ වගකීම්

2.8.1 සේවක අර්ථසාධක අරමුදල/සේවක භාරකාර අරමුදල

සේවකයින් සහ මුද්‍රණ ආයතනය සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදල අනුමත කරන ලද අනුප්‍රමාණයන්ගෙන් දායක වනු ලැබේ.

2.8.2 විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම්

පාරිතෝෂික වෙන්කිරීම් සඳහා ව්‍යාපෘති ඒකක බැර (Projected Unit Credit) ක්‍රමය සරල කර යොදා ගෙන ඇත.

2.9 වෙන්කිරීම්

වගකීම් පිළිබඳ සත්‍ය ඇස්තමේන්තුවක් කළ හැකි සහ එම වගකීම් පියවීම් සඳහා ආර්ථික ප්‍රතිලාභවලින් සමන්විත සම්පත් බැහැර යාමක් සිදුවේයයි නිශ්චිත අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ ආනයනය සතු වගකීමක් (නීතිමය හෝ වටහා ගත හැකි) ඇති විට අදාළ වෙන් කිරීම හඳුනා ගනී.

2.10 ගෙවිය යුතු ශේෂය

ගෙවිය යුතු ශේෂය ගනුදෙනුව සිදු වූ මිලට මූලිකව හඳුනාගනු ලැබේ. එම ශේෂයන් සළුලදායී පොළී අනුපාතය යටතේ පසුකාලීනව අගය කරනු ලබයි.

2.11 මුදල් සහ මුදල් වලට සමාන දෑ

මුදල් සහ මුදල් වලට සමාන දෑ සමන්විත වනුයේ ඇතැති මුදල්, බැංකු සමඟ ශේෂයන්, ඉල්ලුම් තැන්පතු සහ ව්‍යවහාර මුදල් බවට ඉක්මනින් පරිවර්තනය කළ හැකි වූ දළ වටිනාකම වෙනස්වීම පිළිබඳ සැලකිය යුතු අවධානමක් නොමැති වූ ද කෙටි කාලීන හා අධික ද්‍රවශීලතා තත්වයන්, පවත්නා ආයෝජන වේ.

2.12 ආදායම් හඳුනා ගැනීම

අනාගත ආර්ථික ලාභ ආයතනයට ගලා එන බවට සම්භාවිතාවන් ඇත්නම් සහ ආදායම් විශ්වාසනීය ලෙස අගය කල හැකි තරමට පමණක් ආදායම් හඳුනා ගනු ලැබේ.

සේවා සැපයීම

සේවා සැපයීමට අදාළ ආදායම සේවාව සැපයූ කාල පරිච්ඡේදයේදී හඳුනා ගනු ලැබේ.

පොළි ආදායම

පොළි ආදායම සඵල පොළී අනුපාතිකය භාවිතා තරමින් වාර්තා කරනු ලැබේ,

2.13 **වියදම් හඳුනා ගැනීම**

ආදායම ඉපයීමට අදාල සියළු වියදම් එම ආදායමට එරෙහිව කපා වර්ෂය තුල ගිණුම්ගත කර ඇත. ආයතනය පවත්වාගෙන යාමට අදාළ සියළු වියදම් හා දේපල, පිරියත හා උපකරණ කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාමට අදාළ වියදම් ලාභයට එරෙහිව වර්ෂය තුලදී ගිණුම්ගත කර ඇත.

1 දේපල, පිරියත හා උපකරණ

		2016/01/01 දිනට ශේෂය	වර්ෂය තුල එකතු කිරීම්	මාරු කිරීම්	වර්ෂය තුල ඉවත් කිරීම්	2016/12/31 දිනට ශේෂය
		රු.	රු.	රු.	රු.	රු.
සලකනු ලබන පිරිවැය						
යන්ත්‍ර	ප්‍රධාන කාර්යාලය	6,061,567.76	50,762.20	-	(8,478.80)	6,103,851.16
පරිගණක	ප්‍රධාන කාර්යාලය	6,425,252.46	232,000.00	-	-	6,657,252.46
පිරිවැය						
ලී බඩු හා සවි කිරීම්-	ප්‍රධාන කාර්යාලය	1,132,561.71	299,217.50	-	(43,400.00)	1,388,379.21
	මාතලේ ශාඛාව	8,700.00	-	-	-	8,700.00
කාර්යාල උපකරණ -	ප්‍රධාන කාර්යාලය	677,831.08	3,450.00	-	-	681,281.08
	මාතලේ ශාඛාව	5,750.00	-	-	-	5,750.00
පුස්තකාල පොත්		732,495.89	-	-	-	732,495.89
ඉවුම් පිහුම් උපකරණ		16,574.90	2,900.00	-	-	19,474.90
බුමුතුරුණු		314,945.80	-	-	-	314,945.80
නාම පුවරු		89,937.60	-	-	-	89,937.60
එකතුව		**15,465,617.20**	**588,329.70**	**-**	**(51,878.80)**	**16,002,068.10**

ක්ෂයවීම්		2016/01/01 දිනට සමුච්චිත ක්ෂය	වර්ෂය තුල ක්ෂය කිරීම	අපහරණයන්	වර්ෂය තුල ඉවත් කිරීම්	2016/12/31 දිනට සමුච්චිත ක්ෂය
		රු.	රු.	රු.	රු.	රු.
සලකනු ලබන පිරිවැය						
යන්ත්‍ර	ප්‍රධාන කාර්යාලය	3,069,863.41	607,586.85	-	(6,500.41)	3,670,949.85
පරිගණක	ප්‍රධාන කාර්යාලය	4,547,117.47	994,394.99	-	-	5,541,512.46
පිරිවැය						
ලී බඩු හා සවි කිරීම්	ප්‍රධාන කාර්යාලය	553,770.98	104,600.17	-	(43,400.00)	614,971.15
	මාතලේ ශාඛාව	7,830.00	870.00	-	-	8,700.00
කාර්යාල උපකරණ -	ප්‍රධාන කාර්යාලය	586,845.91	11,802.33	-	-	598,648.24
	මාතලේ ශාඛාව	5,175.00	575.00	-	-	5,750.00
පුස්තකාල පොත්		700,910.67	16,151.34	-	-	717,062.02
ඉවුම් පිහුම් උපකරණ		10,600.73	824.17	-	-	11,424.90
බුමුතුරුණු		294,903.41	4,008.48	-	-	298,911.89
නාම පුවරු		25,829.92	8,453.76	-	-	34,283.68
එකතුව		**9,802,847.51**	**1,749,267.09**	**-**	**(49,900.41)**	**11,502,214.18**
ශුද්ධ පොත් අගය		**5,662,769.69**				**4,499,853.92**

දෙසැම්බර් 31 දිනට		2016	2015
		රු.	රු.

2 අස්පෘෂ්‍ය වත්කම් සටහන්

පරිගණක මෘදුකාංග		
පිරිවැය		
ආරම්භක ශේෂය	216,740.00	72,240
එකතුවීම්	17,825.00	144,500
අඩමාණ ණය සඳහා වෙන්කිරීම්	-	-
වසර අවසාන ශේෂය	**234,565.00**	**216,740**
සමුච්චිත කපා හැරි අගය		
ආරම්භක ශේෂය	72,240.00	72,240
කපා හැරීම්	51,137.50	-
වසර අවසාන ශේෂය	**123,377.50**	**72,240**
වසර අවසාන ශුද්ධ ශේෂය	**111,187.50**	**144,500**

3 වෙළඳ හා අනෙකුත් ලබීම්

ණයගැතියන්	3.1	5,915,125.00	4,202,100
කාර්ය මණ්ඩල ණය ගැතියන්	3.2	458,810.13	624,124
		6,373,935.13	**4,826,224**

3.1 ණය ගැතියන්

ණයගැතියන් -	ප්‍රධාන කාර්යාලය	8,902,599.50	6,676,875
	මාතලේ ශාඛාව	474,950.00	362,700
		9,377,549.50	7,039,575
අඩමාණ ණය සඳහා වෙන්කිරීම්	ප්‍රධාන කාර්යාලය	(3,214,974.50)	(2,656,025)
	මාතලේ ශාඛාව	(247,450.00)	(181,450)
		5,915,125.00	**4,202,100**

3.2 කාර්ය මණ්ඩල ණය ගැතියන්

එම්. ඩබ් සනත්	-	33,334
එම්. ටී. ඩී. විජේසිරි	122,230.00	188,890
චමල් හෙට්ටිආරච්චි	77,790.09	144,450
ඩබ් ඒ. එම්. ලංකාතිලක	56,000.00	104,000
ඩී. එස්. එස්. බරණගේ	77,790.00	144,450
සමන්ත කුලතුංග	125,000.04	-
උත්සව දීමනා -		
ප්‍රධාන කාර්යාලය	-	8,000
මාතලේ ශාඛාව	-	1,000
	458,810.13	**624,124**

දෙසැම්බර් 31 දිනට			2016	2015
		සටහන්	රු.	රු.
4	**කලින් කල ගෙවීම්**			
	නව ගොඩනැගිලි සඳහා අත්තිකාරම් ගෙවීම්		3,582.10	-
	වෙබ් අඩවියක් ආරම්භ කිරීමේ ගාස්තු		5,957.95	5,163
			9,540.05	**5,163**
5	**කෙටි කාලීන ආයෝජන**			
	භාණ්ඩාගාර බිල්පත්		3,767,653.95	3,521,647
	භාණ්ඩාගාර බිල්පත් මත පොළී ලැබීම්		145,998.72	97,900
			3,913,652.67	**3,619,548**
	ස්ථාවර තැන්පත්		62,857,007.48	56,925,962
	ස්ථාවර තැන්පත් මත පොළී ලැබීම්		3,304,704.92	2,378,050
			66,161,712.40	**59,304,012**
			70,075,365.07	62,923,560
6	**මුදල් හා මුදල් වලට සමාන දෑ**			
	මහජන බැංකුව - ජංගම ගිණුම් අංක	i	2,070,657.51	2,148,875
	ජංගම ගිණුම් අංක	ii	993,122.91	441,373
	අතැති මුදල්		5,373.00	5,373
			3,069,153.42	**2,595,621**
7	**සමුච්චිත අරමුදල**			
	ජනවාරි 01 දිනට ශේෂය		73,986,438.31	66,848,482
	විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයෙන් මාරු කිරීම		7,628,441.96	7,137,957
	දෙසැම්බර් 31 දිනට ශේෂය		**81,614,880.27**	**73,986,438**

දෙසැම්බර් 31 දිනට		2016	2015
		රු.	රු.
	සටහන්		
8 විශ්‍රාමික පාරිතෝෂික වෙන්කිරීම්			
ජනවාරි 01 දිනට ශේෂය		1,012,550.25	920,610
වර්ෂය තුල වෙන් කිරීම්			
ප්‍රධාන කාර්යාලය		88,330.50	83,417
මාතලේ ශාඛාව		8,643.00	8,523
		1,109,523.75	**1,012,550**
වර්ෂය තුල ගෙවීම්		-	-
දෙසැම්බර් 31 දිනට ශේෂය		1,109,523.75	1,012,550
9 වෙළඳ හා අනෙකුත් ගෙවීම්			
අනෙකුත් ගෙවීම්		30,700.00	90,700
ගෙවිය යුතු වියදම්	9.1	1,383,931.07	1,068,149
		1,414,631.07	**1,158,849**
9.1 උපචිත වියදම්			
කාර්යාල කාර්ය සහායකට දීමනා		2,702.60	9,750
ගිණුම්කරණ ගාස්තු සහ අනිකුත් වෘත්තීමය ගාස්තු		141,585.00	68,166
විගණන ගාස්තු		620,280.00	495,280
වැටුප් හා අතිකාල දීමනා		12,167.38	11,990
ප්‍රායෝගික ගාස්තු - ප්‍රධාන කාර්යාලය		91,053.00	88,575
දේශන ගාස්තු		184,630.00	145,350
අන්තර්ජාල සේවා ගාස්තු		1,053.68	959
සුභසාධන වියදම්		11,174.00	11,503
ගරු දීමනා		-	16,008
නඩත්තු වියදම්		2,500.00	2,500
රැස්වීම් සඳහා පැමිණීමේ ගාස්තු		13,000.00	13,000
ඒකාබද්ධ අරමුදල්		2,002.00	2,409
දුරකථන - මූලස්ථානය		10,372.82	9,145
දුරකථන - මාතලේ		5,779.53	1,779
සභාපතිතුමාගේ දීමනා		-	7,500
ඡායා පිටපත් වියදම්		20,115.96	12,849
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීමේ ගාස්තු		1,500.00	1,500
තොරතුරු තාක්ෂණ උපකරණ ගාස්තු		4,000.00	4,000
ප්‍රසාද දීමනා - මූලස්ථානය		202,500.00	150,000
මාතලේ		22,500.00	15,000
පරිවර්තන වියදම්		600.00	600
උපයන විට ගෙවන බදු		285.00	285
විදුලිය මාතලේ		1,283.10	-
උසස් ඩිප්ලෝමාව සඳහා සම්බන්ධීකරණ වියදම්		10,000.00	-
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය		12,075.00	-
ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අමුද්‍රව්‍ය		4,000.00	-
ප්‍රචාරක වියදම්		5,772.00	-
උසස් ඩිප්ලෝමා ලිපිකරු වියදම්		1,000.00	-
		1,383,931.07	**1,068,149**

	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2016	2015
		රු.	රු.
10	**පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම්**		
	පාඨමාලා ගාස්තු	20,897,448.00	19,222,273
	ලියාපදිංචි ගාස්තු	471,250.00	338,450
	විභාග ගාස්තු	33,000.00	8,970
	වැඩමුළු ආදායම	-	432,500
		21,401,698.00	**20,002,193**

11	**ශුද්ධ අතිරික්තය / (ඌණතාවය) - මාතලේ ශාඛාව**		
	ආදායම්		
	පාඨමාලා ගාස්තු	664,000.00	460,000
	වියදම්		
	සේවක වේතන හා ප්‍රසාද දීමනා	450,252.00	376,312
	සේවක අර්ථසාධක අරමුදල	22,818.24	22,645
	සේවක භාරකාර අරමුදල	5,704.62	5,661
	විදුලිය	8,834.88	9,562
	ක්ෂයවීම්	1,445.00	1,445
	දුරකථන	17,829.12	10,736
	අපහායනය සඳහා වෙන් කිරීම්	66,000.00	16,450
	පාරිතෝෂික වෙන් කිරීම්	8,643.00	8,523
		581,526.86	**451,335**
	වියදමට වැඩි ආදායම	**82,473.14**	**8,665**

	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2016	2015
		රු.	රු.
12	**පාඨමාලා ගාස්තු, ලියාපදිංචි ගාස්තු, විභාග ගාස්තු සහ අනෙකුත් මෙහෙයුම් ආදායම් මත සෘජු වියදම්**		
	කාර්ය මණ්ඩල වැටුප්, ප්‍රසාද දීමනා හා අතිකාල දීමනා	2,188,318.00	2,161,001
	සේවක අර්ථසාධක අරමුදල	170,370.56	174,672
	සේවක භාරකාර අරමුදල	42,678.27	43,668
	දේශන ගාස්තු හා ඒකාබද්ධ අරමුදලට ගෙවීම්	2,467,929.50	1,515,167
	ප්‍රායෝගික ගාස්තු හා ඒකාබද්ධ අරමුදලට ගෙවීම්	1,268,875.33	1,496,758
	ගරු දීමනා හා ඒකාබද්ධ අරමුදලට ගෙවීම්	145,796.00	170,249
	නඩත්තු ගාස්තු	30,000.00	30,000
	තොරතුරු තාක්ෂණ උපකරණ නඩත්තු	48,000.00	36,000
	සම්මන්ත්‍රණ වියදම්	-	216,850
	ඡායා පිටපත් වියදම්	225,620.96	192,456
	ප්‍රායෝගික පරීක්ෂණ සඳහා අමුද්‍රව්‍ය	49,504.81	23,435
	ලිපිද්‍රව්‍ය හා මුද්දර	136,692.50	138,447
	කුළී, විදුලිය හා ජලය	849,700.00	792,700
	උසස් ඩිප්ලෝමා වැඩ සටහන සඳහා ගිය වියදම්	65,000.00	-
	පුහුණු වැඩ සටහන් වියදම්	361,685.00	10,180
	විභාග පරීක්ෂණ වියදම්	11,700.00	-
	විභාග වීළිතුරු පත්‍ර පරීක්ෂණ වියදම්	19,900.00	-
	කොළඹ විශ්ව විද්‍යාලයේ දේශන වියදම්	-	1,900,000
	NVQ තත්වකරණ රැස්වීම් සඳහා	-	2,000
		8,081,770.93	**8,903,580**
13	**අනෙකුත් ආදායම**		
	ගිය වසරේ වැටුප් වැඩිපුර ගෙවීම් නැවත අයකර ගැනීම	9,456.00	25,296
	විවිධ ආදායම්	-	17,550
	ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය	12,861.61	123,412
		22,317.61	**166,258**
14	**සේවක වියදම්**		
	කාර්ය මණ්ඩල වැටුප්, ප්‍රසාද දීමනා, අතිකාල හා දීමනා	3,034,497.51	2,427,455
	සේවක අර්ථසාධක අරමුදල	186,168.00	180,876
	සේවක භාරකාර අරමුදල	46,542.00	45,219
	කම්කරු වියදම් හා කාර්යාල කාර්ය සහායක දීමනා	127,249.55	111,550
	සුභසාධන වියදම්	115,322.00	92,230
	කාර්ය මණ්ඩල පුහුණු කටයුතු සඳහා	1,200,409.39	33,500
	පාරිතෝෂික වෙන්කිරීම්	88,330.50	83,417
		4,798,518.95	**2,974,246**

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2016	2015
	රු.	රු.

15 අනෙකුත් මෙහෙයුම් වියදම්

සභාපතිට දීමනා	180,000.00	67,500
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් සඳහා පැමිණීමේ දීමනා	228,000.00	5,000
අධ්‍යයන කටයුතු සඳහා පැමිණීමේ දීමනා	-	9,000
තත්ව සහතික වියදම්	243,940.00	168,320
ගමන් ගාස්තු	8,840.00	14,220
ගමන් ගාස්තු - අලෙවි කළමනාකරුවන් සඳහා	72,000.00	72,000
අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම් වියදම	18,465.00	2,320
යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා හා නඩත්තු වියදම්	259,713.96	855,954
දුරකථන	133,400.93	154,014
අන්තර්ජාල සේවා ගාස්තු	5,696.76	5,449
ගිණුම්කරණ වියදම් සහ අනිකුත් වෘත්තීමය වියදම්	249,399.00	169,929
විගණන ගාස්තු	125,000.00	125,000
රක්ෂණ වියදම්	4,364.61	4,365
ප්‍රචාරක වියදම්	534,868.01	383,373
පාඨමාලා ප්‍රවර්ධනය කිරීමේ වියදම්	12,000.00	5,250
අපහායනය සඳහා වෙන් කිරීම්	2,139,400.00	1,075,575
බැංකු ගාස්තු	53,783.77	3,004
ඇමතිතුමා පැමිණීමේ වියදම්	5,000.00	29,000
ප්‍රදර්ශන සඳහා වියදම්	18,200.00	34,760
පරිවර්තන ගාස්තු	41,358.00	9,325
වෙබ් අඩවියක් ආරම්භ කිරීමේ ගාස්තු	6,354.65	6,196
විවිධ වියදම්	34,891.43	8,529
කපා හල ගොඩනැගිලි අත්තිකාරම්	-	227,370
සේ.නි.හ.අ. අධිභාරය	-	2,671
	4,374,676.12	**3,438,122**

16 ශුද්ධ මූල්‍ය ආදායම්

පොළී ආදායම	5,151,808.96	3,854,936
සේවක ණය පොළී ලැබීම්	24,069.83	26,701
	5,175,878.79	**3,881,638**

විගණකාධිපති වර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය எனது இல. My No. } විවිවයි/ඊ/එස්එල්අයිඕපී/01/16/23

ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2017 සැප්තැම්බර් 12 දින

සභාපති

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතේ 25(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උපචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත අනුව රජයේ මුද්‍රණාලයාධිපති නිල බලයෙන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාලක මණ්ඩලයට පත්වන අතර පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එක් අයෙකු එහි සභාපතිවරයා ලෙස පත් කිරීමට අදාල අමාත්‍යවරයාට බලය ඇත. කෙසේ වුවද, රජයේ මුද්‍රණාලයාධිපති ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ආරම්භයේ සිටම එහි සභාපතිවරයා ලෙස කටයුතු කර තිබුණි.

එසේම විධිමත් ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොමැතිව හා කිසිදු ගෙවීමකින් තොරව ශ්‍රී ලංකා මුද්‍රණ දෙපාර්තමේන්තු පරිශ්‍රය තුළ ආයතනය පවත්වාගෙන යාමට අවසර දී තිබුණු අතර ඊට අවශ්‍ය ඉඩ පහසුකම්, විදුලිය හා ජලය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් සපයනු ලැබේ. තවද, කිසිදු ගාස්තු අය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ගාස්තුව රු. 849,700 ක් වූ පුහුණු පාඨමාලා 12 ක් සඳහා මුද්‍රණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 42 ක් සහභාගී කර ගෙන තිබුණි. එහෙත් උක්ත සම්බන්ධිත පාර්ශව සහ සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියන්හි 1 පරිච්ඡේදයේ 1.1 වගන්තිය ප්‍රකාරව භාණ්ඩ අලෙවි කිරීම සඳහා හෝ සේවා සැපයීම සඳහා පිහිටුවා ඇති රාජ්‍ය සංස්ථා සඳහා මෙම ප්‍රමිත භාවිතා නොකළ යුතු බව දක්වා තිබියදී ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මෙම ප්‍රමිත අනුගමනය කර ගිණුම් සකස් කර තිබුණි.

(ආ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියන්හි පරිච්ඡේද 17 හි 19 වගන්තිය පරිදි ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.1,604,253 ක්වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2016 දෙසැම්බර් 31 දිනට රු.3,462,424 ක බොල් ණය ප්‍රතිපාදනයක් මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා තිබූ නමුත් බොල් ණය වෙන් කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

2013 සැප්තැම්බර් 18 දින නිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් ආයතනයට පවරා දී තිබූ හෙක්ටයාර් 0.1012 ක (පර්චස් 40ක් පමණ) ඉඩමේ වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1984 අංක 08 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතේ 14(1) වගන්තිය ප්‍රකාරව සෑම මාසයකදීම යටත් පිරිසෙයින් එක් වරක්වත් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් පැවැත්විය යුතු වුවත් 2016 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08 ක් පමණක් පවත්වා තිබුණි. පනත ප්‍රකාරව පත්කර ඇති අධ්‍යක්ෂවරුන් 9 දෙනා ගෙන් තිදෙනෙකු 2016 වර්ෂයේ පවත්වන ලද කිසිදු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකට සහභාගී වී නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 7,628,442 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 7,137,957 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 490,485 කින් වර්ධනය වී තිබුණි. කාර්ය මණ්ඩල වියදම් හා වෙනත් මෙහෙයුම් වියදම් රු. 2,760,827 කින් වැඩි වුවද මෙහෙයුම් ආදායම රු. 2,151,182 කින් ඉහළ යාම වර්ෂයේ අතිරික්තය වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා උච්චාවචනයන් සහිතව අතිරික්තය වර්ධනය වී තිබුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගත් පසු ආයතනයේ දායකත්වය 2012 වර්ෂයේ දී රු. 11,974,086 ක් වූ අතර උච්චාවචනයන් සහිතව 2016 වර්ෂයේ දී රු.14,225,921 ක් දක්වා වැඩි වී තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත අනුව මුද්‍රණ කේෂත්‍රයෙහි දැනට සේවා නියුක්ත තැනැත්තන් පුහුණු කිරීම හා සහතික ප්‍රදානය මුද්‍රණ තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම, නව විෂය මාලා, ශිල්පී ක්‍රම කාර්යාවලි පිළිබඳ වාර ප්‍රවෘත්ති පත්‍රිකා හෝ වෙනත් ප්‍රකාශන නිකුත් කිරීම හා මුද්‍රණ කර්මාන්තයට සම්බන්ධ වෘත්තීය ප්‍රදර්ශනවලට සහභාගී වීම හා එතෙර පුහුණුවීම් සමාරම්භ කිරීම හා හුවමාරු ක්‍රමයක් මත අන්‍යොන්‍ය පුහුණුව ලබාදීම හා ලබා ගැනීම ආයතනයේ ප්‍රධාන අරමුණු විය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් සමාලෝචිත වර්ෂය තුළ නිර්මාණ සැලසුම් හා සන්නිවේදන, නොරතුරු සන්නිවේදන හා තාක්ෂණ සහ මුද්‍රණ සහ ඇසුරුම් යන ක්ෂේත්‍ර 03 ක පාඨමාලා 14 ක් යටතේ පුහුණු වැඩසටහන් 73 ක් සඳහා සිසුන් 935 ක් බඳවාගෙන තිබුණි.

(ආ) සංයුක්ත සැලැස්ම පරිදි සියලු පාඨමාලා ජාතික ප්‍රතීතන මට්ටම් අනුව පැවැත්වීම අරමුණු වුවද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පවත්වන පාඨමාලා 08 ක් සඳහා ජාතික පුහුණු සම්මත හඳුන්වා දී නොතිබීම හා පුහුණු සම්මත අනුව පාඨමාලා නොපැවැත්වීම නිසා පාඨමාලා 02 ක් සඳහා පමණක් ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ) සඳහා ප්‍රතීතනය කර තිබුණි. පුහුණු සම්මත අනුව පුහුණු පැය ගණන වැඩිකිරීමට සිදුවීමෙන් පාඨමාලාවල ගාස්තු වැඩිවීම නිසා ආධුනික ආකර්ෂණය අඩුවේ යැයි අපේක්ෂාවෙන් ප්‍රතීතන මට්ටම් හඳුන්වාදී තිබූ පාඨමාලා ප්‍රතීතනය කර ගැනීමට යොමු වී නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්ම පරිදි විදේශ සේවා නියුක්තිය සඳහා ජාත්‍යන්තර මට්ටමේ වෘත්තීය සුදුසුකම් වලින් යුත් ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම ආයතනයේ අරමුණු වලින් ප්‍රධාන එකක් විය. විදේශ සේවා නියුක්ති කාර්යංශය මඟින් 2016 නිකුත් කර තිබූ විදේශ සේවා නියුක්ති පිළිබඳ සංඛ්‍යා ලේඛන වාර්තාව අනුව මුද්‍රණ ක්ෂේත්‍රවල 2014 හා 2015 වර්ෂවල සපුරා ගත නොහැකිව තිබූ පිළිවෙලින් 361 සහ 261 ක් වූ විදේශ රැකියාවලට සුදුසු පුද්ගලයන් බිහිකිරීමට අවධානය යොමුකර නොතිබුණි.

(ඈ) පුහුණුව අවසන් කරන ශිල්පීන්ගේ රැකියා නියුක්ති තත්ත්ව පිළිබඳ පසු විපරම් කර පුහුණු පාඨමලාවල ඵලදායකත්වය වර්ධනය කර ගැනීම සඳහා ඒ පිළිබඳ ඇගයීමක් කර නොතිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සඳහා රු.56,725 ක් වැය කර ආයතන කාර්ය පරිපාටිය හා මූල්‍ය කාර්ය පරිපාටිය 2009 වර්ෂයේදී පිළියෙල කර අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද 2017 අප්‍රේල් වන විටත් එම අනුමැතිය ලැබී නොතිබුණි. එහෙත් ඒ පිළිබඳ කිසිදු පසුවිපරමක් ආයතනය විසින් සිදුකර ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

(ආ) ආයතනය විසින් ආධුනිකයන්ගෙන් අය කරන පාඨමාලා ගාස්තු ඉහළ දැමීමේදී පදනම් කර ගන්නා කරුණු ඇතුළත් විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

4.3 අරමුදල් ඌන උපයෝජනය

ආයතනයේ මෙහෙයුම් කටයුතු පුළුල් කර අරමුණු ළඟා කර ගැනීමට උපයනු ලබන ආදායම් වැය නොකර ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබූ අතර 2016 දෙසැම්බර් 31 දිනට ආයෝජනය කර ඇති මුදල රු.70,075,365 ක් විය.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 13 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 09 ක් වීම හේතුවෙන් ස්ථිර උපදේශක තනතුරු 04 ක් පුරප්පාඩුව පැවතුණි. කෙසේ වුවද පාඨමාලා පැවැත්වීම සඳහා අර්ධ කාලීන කථිකාචාර්යවරු සහ උපදේශකවරු 32දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් උපදේශකවරු දෙදෙනෙකුගේ සේවය ලබා ගෙන තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2012 – 2016 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම සමාලෝචිත වර්ෂයට ගැළපෙන පරිදි යාවත්කාලීන කර නොතිබුණි. තවද උක්ත සංයුක්ත සැලැස්මේ ඇතුළත් නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම, විදේශ සේවා නියුක්තිය සඳහා ජාත්‍යන්තර වෘත්තීය සුදුසුකම්වලින් හා බහු හැකියාවන්ගෙන් යුත් ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම, ආයතනය සඳහා නව සංවිධාන සැලැස්මක් ස්ථාපිත කිරීම හා ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ලබා ගැනීම යන කාර්යයන් ඉටුකර නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

පනතේ අරමුණු ආවරණය වන පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

2011 දෙසැම්බර් 23 දිනැති අංක ඩීඑම්ඒ/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය පරිදි ආයතනය තුළ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ හේතුවෙන් චක්‍රලේඛය පරිදි ආයතනයේ කටයුතු කාර්යක්ෂමව, ඵලදායීව සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්ට අනුකූලව සිදු කරන බව තහවුරු කර ගැනීමට ක්‍රමවේදයක් ආයතනයට නොමැති විය.

5.4 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 10 සිට සියයට 4,702 දක්වා විචලනයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගි කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) ආදායම් පාලනය	පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීම සඳහා ක්‍රමවේදයක් නොතිබීම.
(ආ) ණයගැති පාලනය	බොල් ණය වෙන් කිරීමේ විධිමත් ක්‍රම වේදයක් නොතිබීම හා ණය අයකර ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම.

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය 1984 අංක 18 දරණ පනතින් ස්ථාපනය කරන ලද අතර මෙම මුද්‍රණ ආයතනය ආරම්භක නියමුවා ද වූයේ 1984 එවකට රජයේ මුද්‍රණාල ධූරය දරපු රජයේ මුද්‍රණාලාධිපතිවරයායය. ඔහුගේ සංකල්පයක් මත එවකට හිටපු ජනමාධ්‍ය අමාත්‍ය තුමාගේත් අනුමැතිය යටතේ මෙය රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාල පරිශ්‍රයේ ගොඩනැගිල්ලක ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය නමින් රජයේ මුද්‍රණාලයේ අනුග්‍රහය යටතේ ස්ථාපනය කරන ලදී. ආරම්භයේ සිට අද දක්වාම රජයේ මුද්‍රණාලයේ සේවකයන් පුහුණු කරනු ලබන්නේ අප ආයතනය විසිනි. රටේ මුද්‍රණ කර්මාන්තය නඟා සිටුවීම සඳහා දැනට මුද්‍රණ සේවයේ නියැලෙන ශ්‍රමිකයන්ට හා ක්ෂේත්‍රයට ඇතුලුවන නවකයින්ට ද අවශ්‍ය කරන තාක්ෂණ දැනුම ලබාදෙන එකම ආයතනය ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයයි. රජයේ මුද්‍රණාලය හා ඒකාබද්ධව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පවත්වාගෙන යෑමේ ප්‍රධාන හේතුව වන්නේ මුද්‍රණ කර්මාන්තයේ ඉතිහාසයේ සිට අද නූතන තාක්ෂණය දක්වාම ඇති යන්ත්‍රෝපකරණ රජයේ මුද්‍රණාලය සතුව පවතී. ඒ පිළිබඳ දැනුම මුද්‍රණ කර්මාන්තයේ නියැලෙන අයට හා දැනට මෙම ක්ෂේත්‍රයට අවතීර්ණ වන නවකයින්ට ද ලබාදීම තුලින් රට තුල මුද්‍රණ කර්මාන්තය නඟා සිටුවීමට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතය හා රජයේ මුද්‍රණාලය එක්ව අමාත්‍යාංශයේ අනුමැතිය ඇතිව සිදු කරනු ලබන්නේ මෙම ක්ෂේත්‍රයට මහඟු සේවයකි.

එබැවින් රජයේ මුද්‍රණාලයේ පරිශ්‍රය තුල ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පවත්වාගෙන යාම නිසා මුද්‍රණ කර්මාන්තය පිළිබඳ අධ්‍යයන කටයුතු ඉතා පුළුල්ව කරගෙන යාමට හැකියාව ලැබී ඇත.

ගාස්තු අය කිරීමකින් තොරව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තු සේවකයින් පුහුණු කිරීම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ආරම්භයේ සිට අද දක්වාම සිදුවේ. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය රජයේ භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබානොගන්නා අතර පාඨමාලාවන් තුලින් උපයන මුදලින් ආයතනයේ පරිපාලන වියදම් ඇතුලුව සියලුම නඩත්තු කටයුතු කරගෙන යනු ලැබේ. ඉතාමත්ම සීමිත සේවක මණ්ඩලයකින් මෙම ආයතනය පවත්වාගෙන යන අතර මේ වන විට අප ආයතනය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මගින් නිකුත්කරන ෂීධ සහතිකය ද ලබාගෙන ඇත. රජයේ මුද්‍රණාලයේ සේවකයන්ට හැර අනෙකුත් සියුන්ගෙන් සාධාරණ මුදලක් අයකර පාඨමාලා පවත්වා ඒ ලැබෙන මුදලින් ආයතනයත්, සේවක පිරිසත් නඩත්තු කෙරේ. මීට දක්වන රුකුලක් ලෙස රජයේ මුද්‍රණාලයෙන් අවශ්‍ය යටිතල පහසුකම් නොමිලේ සපයා ඇත. ඒවා අතර විදුලිය, ජලය සැපයීමද සිදුවේ.

මේ අනුව රජයේ මුද්‍රණාලයේ සේවකයන් හට නොමිලේ පිරිනමනු ලබන ශෂ්‍යත්ව වලට හා පාඨමාලාවන් වල එකතුව සෑම වර්ෂයක් තුලම මූල්‍ය ප්‍රකාශන වල කුලී, විදුලිය හා ජල ගාස්තු ගිණුමට හර කරනු ලැබේ. එම ප්‍රමාණයම පාඨමාලා ආදයම් ගිණුමට බැර කරනු ලැබේ. මෙම ක්‍රියාවලිය දෙපාර්ශ්වයම අනුමත කර ගෙන එකඟත්වයකට එළඹී ඇත.

2.2.2 ගිණුම්කරණ ප්‍රමිති

අප ආයතනයේ මූල්‍ය වාර්තා සකස් කරනු ලබන්නේ බාහිර වරලත් ගණකාධිකාරී ආයතනයක් මගිනි. මේ සම්බන්ධව ඔවුන්ව දැනුවත් කල අතර ඔවුන්ගේ උපදෙස් අනුව ඉදිරියේ දී අවශ්‍ය පරිදි වෙනස්කම් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

(අ) සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති එනමුත් භාවිතයේ ඇති පිරිවැය රු. 1,604,253/= ක් වූ වත්කම් නැවත සලකා බලා ප්‍රත්‍යාගනනය කර ගිණුම් වල ඒලි දක්වීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ආ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ආයතනයේ බොල් ණය කපා හැරීමේ ප්‍රතිපත්තිය වනුයේ වර්ෂ 02 ක වැඩි සියලුම ණය මුදල් බොල් ණය හැටියට කපා හැරීමය. මේ සම්බන්ධව පාලක මණ්ඩලය අනුමැතිය ලබාගෙන ඇත.

2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සතුව පවතින මෙම ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දැක්වීමට නොහැකි වූයේ මෙගාපොලිස් අමාත්‍යාංශය විසින් මෙම ඉඩමෙන් යම් කොටසක් අත්පත් කරගන්නා බවට නිකුත් කර ඇති ප්‍රකාශයක් හේතුවෙනි. දැනට මෙම ඉඩම තක්සේරු කිරීමට නොහැකි තත්ත්වයක් මතුව ඇත. ඒ පිළිබඳව පැහැදිලි තීරණයක් ලැබීමෙන් අනතුරුව අවශ්‍ය කටයුතු කළ හැකි වනු ඇත.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

(අ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සෑම වර්ෂයකම වෘත්තිය ප්‍රදර්ශන වලට සහභාගි වේ. තවද සෑම වර්ෂයක් තුලම මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලුන අයට මෙන්ම අලුතින් ක්ෂේත්‍රයට ඇතුලුවන නවකයින්ට සම්මන්ත්‍රණ පවත්වා ඇත. ජර්මනිය සහ ඉන්දියාව විසින් පවත්වනු ලැබූ මුද්‍රණ/ග්‍රැෆික්ස් වැඩ සටහන් ශිෂ්‍යත්ව සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සේවක මහතුන්ව සහභාගි කරවා ඇත.

තවද අත් පත්‍රිකා, ප්‍රවෘත්ති සහ වෙළි මාධ්‍ය තුලින් පාඨමාලා සහ අධ්‍යයන කටයුතු පිළිබඳ තොරතුරු මහත් සේ ප්‍රචාරය කර ඇත.

(ආ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 80% ක් පමණ පාඨමාලා සකස් කර ඇත්තේ මුද්‍රණ ක්ෂේත්‍රයේ ඇති ඉල්ලුමට අනුවය. ඒ අනුව මෙම පාඨමාලා සඳහා යොමු වන්නේ මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි සුළු කොටසක් පමණි. NVQ මට්ටම ලබා ගැනීම සඳහා ප්‍රතිනතය කරනු ලබන්නේ විශාල ඉල්ලුමක් ඇති පාඨමාලා පමණක් වන අතර අනෙකුත් පාඨමාලා NVQ මට්ටම ප්‍රතිනතය කිරීම ඵලදායි නොවන බව අපගේ මෙන්ම TVEC ආයතනයේද හැඟීම වේ. ඒ අනුව විශාල ඉල්ලුමක් ඇති මුද්‍රණ පාඨමාලාව සහ ග්‍රැෆික්ස් පාඨමාලාව NVQ සඳහා ප්‍රතිනතය කොට ඇත.

(ඇ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මුද්‍රණ හා ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට වසකරට 800-1000 අතර වෘත්තිය සුදුසුකම් වලින් සපිරි ශ්‍රම බලකායක් බිහි කරයි. මොවුන් මෙරට සහ විදේශ රැකයාවල නියුක්තව ඇත. ආරම්භයේ සිට මේ වන විට මෙම ආතනය 25000 ක් පමණ පිරිසක් මුද්‍රණ හා ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට බිහි කර ඇත. මොවුන් ගේ රැකියාවල නියුක්තිය පිළිබඳ පැහැදිලි වාර්තාවක් අප සතුව නොමැත. රැකියා අවශ්‍ය කෙරෙන තරුණ තරුණයන්ව අප ආයතනය මගින් රැකියා ලබාදේ.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට ඇතුල්වන ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගෙන් 40% ක් 50% අතර ප්‍රමාණයක් රැකියාවල නියුතු අය වේ. ඔවුන් විශේෂයෙන් පැමිණෙන්නේ තම ක්ෂේත්‍රයට අදාල මුද්‍රණ පාඨමාලා හැදෑරීම සඳහාය. ඊට අමතරව පුහුණුව අවසන් කරන ශිල්පීන්ට ඔවුන්ගේ ඉල්ලීම මත රැකියාගත කරනු ලැබේ. මේ පිළිබඳව පැහැදිලි ලේඛණයක් පවත්වාගෙන යාම ඉතා අසීරු කාරණාවක් වන අතර ඉදිරියේ දී මේ සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු සැලසුම් කර ඇත.

(ඈ) පුහුණුව අවසන් කරන ශිල්පීන්ගේ රැකියා නියුක්ති තත්ත්වය පිළිබඳ පසු විපරම් මෙහෙයුමක් 2017 වසරේ සිට ආරම්භ කර ඇත.

4.2 කලමණාකරන ක්‍රියාකාරකම්

(අ) අප්‍රේල් සහ දෙසැම්බර් නිවාඩු මාසවල අධ්‍යක්ෂ මණ්ඩල සමහර සාමාජිකයින් විදේශ ගතවන බැවින් හෝ පාලක මණ්ඩල රැස්වීම පැවැත්වීම සඳහා අවශ්‍යය ගණපූර්ණය නොමැති වීම මත පාලක මණ්ඩල රැස්වීම පැවැත්වීමට නොහැකි වී ඇත.

(ආ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සඳහා ආයතන කාර්ය පටිපාටිය හා මූල්‍ය කාර්ය පටිපාටිය අමාත්‍යාංශයට නැවතත් යොමු කොට ඇති අතර අමාත්‍යාශය විසින් ඉදිරියේ දී මේ ගැන තීරණයක් ගනු ඇත.

(ඇ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලාවන් සඳහා ගාස්තු යම් ප්‍රමාණයකින් වැඩි කිරීමත් සමහර වර්ෂ තුල සිදුවේ. අප ආයතනය ස්වයං උත්පාදන ආයතනයක් බැවින් ආයතනය පවත්වාගෙන යාමේ වියදම් සාපේක්ෂව සලකා බලා සාධාරණ ප්‍රමාණයකින් පාඨමාලා ගාස්තු ඉහල දැමීම සිදු කෙරේ. තව ද වෙළඳපලේ ඇති අනිකුත් තරඟකාරී ආයතනයන් හා සැසඳීමේ දී ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා ගාස්තු පහල මට්ටමක පවතී. මේ සඳහා විධිමත් ක්‍රම වේදයක් සකස් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

4.3 අරමුදල් උෂ්ණ උපයෝජනය

දැනට අප ආයතනය සතුව ගොඩනැගිල්ලක් නොමැති අතර රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව සතුව ඇති ගොඩනැගිල්ලක මෙම ආයතනය පවත්වාගෙන යාමට සිදුවී ඇත. මෙම ගොඩනැගිල්ල සතුව ඇති සීමිත ඉඩකඩ තුල අප පාඨමාලාවන්ට ඇතුලත් වන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් වෙනුවෙන් උපරිම සේවාවක් සැපයීමට ඇති ඉඩකඩ ඇහිරී ඇත. එබැවින් ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට මීට වඩා නවීන තාක්ෂණයකින් යුතු පහසුකම් සැපයීම අපගේ ප්‍රධාන අරමුණ වේ. ඉදිරියේදී ඒ සඳහා මෙම ආයෝජිත මුදල් භාවිතා කිරීම අපගේ අරමුණයි.

4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

අතිරික්ත සහකාර කථිකාචාර්යවරයකු නොමැති අතර එම තනතුර මේ වන විට පුරවා ඇත. දැනට පුරප්පාඩු වී ඇති උපදේශක තනතුරු සඳහා අවශ්‍යතාවයන් මත සලකා බැලීමෙන් අනතුරුව ඉදිරියේ දී බඳවාගනු ලැබේ. තව ද අප ආයතනය ස්වයං උත්පාදන ආයතනයක් බැවින් තනතුරු වලට ස්ථිරව බඳවා ගැනීමේ දී එම තනතුරු සඳහා දැනට ඇති අවශ්‍යතාවන් ගැන සලකා බලනු ලැබේ. දැනට බාහිර කථිකාචාර්යවරුන් සහ උපදේශකවරුන්ගේ සේවය ලබාගන්නේ එම පාඨමාලාවන් සඳහා ඇති අදාලත්වය සහ ඉල්ලුම මතය. මෙම බාහිර දේශකවරුන්ට ස්ථිර වැටුපක් නොගෙවනු ලබන අතර එම පාඨමාලාවන් සඳහා දේශන අනුව ගාස්තු ගෙවනු ලැබේ. යම් පාඨමාලාවක මාසිකව දින 04 ක් පමණක් පවත්වනු ලබන අවස්ථාවක බාහිර කථිකාචාර්යවරයෙකු ගේ සේවය ලබා ගැනීම වඩා සුදුසු වන අතර දේශකවරුන් බඳවාගතහොත් යම් අවස්ථාවන් වලදී පාඨමාලාවන් නොපැවැත්වුව ද ඔවුන් හට මාසික වේතනයක් දීමට ආයතනයට සිදුවේ. ඒ අනුව බලන කල අවශ්‍යතාවයට අනුව බාහිර දේශක වරුන්ගේ සේවය ලබා ගැනීම ආයතනයට ඉමහත් ඵලදායී වනු ඇත. මෙම ක්‍රමය ආයතනයේ පැවැත්මට මහත් රුකුලකි.

5. ගිණුම් කටයුතු හා යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ඉදිරි කාලයන් ආවරණය වන පරිදි නව සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීමට මේ වන විට කටයුතු යොදා ඇත. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ආරම්භයේ සිටම සේවා නියුක්තයි සඳහා ජාත්‍යන්තර වෘත්තීය සුදුසුකම් වලින් හා හැකියාවන්ගෙන් යුත් ශ්‍රම බලකායක් බිහි කර ඇත. මේ වන විට ශිෂ්‍ය ශිෂ්‍යයන් 25000 ක් පමණ අප ආයතනය බිහිකර ඇත. මොවුන් මෙරටද විදේශගතවද රැකියාවන්හි නියුක්තව ඇත.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

ආයතනයේ ප්‍රධාන කාර්යය වන්නේ පාඨමාලා පැවැත්වීමය. ක්‍රියාකාරී සැලැස්මක් විශේෂයෙන් සකස්කොට ඇත්තේ ආයතනයේ පාඨමාලා පැවැත්වෙන පිළිවෙල සහ කාලය පදනම් කරගෙනය. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතේ අරමුණු වලට අනුව සේවකයන්ට පුහුණු පාඨමාලා වලට යොමු කිරීම අනිකුත් විශ්ව විද්‍යාල හා එක්ව කටයුතු කිරීම වැනි කාර්‍යයන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මගින් සිදුවේ. මෙම කාරණා ක්‍රියාකාරී සැලැස්මට අනුයුක්ත කර නොමැති අතර පනතේ අරමුණු අනාවරණය වන පරිදි කටයුතු කිරීමට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සැම විටම කටයුතු කර ඇත. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත්තේ අමාත්‍යාංශය අනුමැතියට අනුවය.

5.3 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයක් හෝ විගණකවරයෙක් නොමැත. මේ බව අමාත්‍යාංශයට දැනුවත් කර ඇති අතර ඒ හේතුවෙන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය අමාත්‍යාංශයේ විගණනයට ලක්වන අතර අමාත්‍යාංශය මගින් කාර්තුවකට වරක් පැවැත්වෙන අභ්‍යන්තර විගණක කලමණාකරණ කමිටුවට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයද සහභාගී වේ.

5.4 අයවැය පාලනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය ස්වයං උත්පාදන ආයතනයක් බැවින් අයවැය ගත ආදයම් හා වියදම් තථ්‍ය ආදයම් හා වියදම් අතර විචලනයක් අහඹු අවස්ථාවන් වලදී සිදුවිය හැකි අතර එය නොවැලැක්විය හැකි තත්ත්වයකි. මේ තත්ත්වය අවම කිරීමට ඉදිරියේදී පියවර ගනු ඇත.

6. පද්ධති හා පාලනයන්

(අ) ආදයම් පාලනය

පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීම සඳහා ඉදිරියේ දී අපගේ ගණකාධිකරන ආයතනය හා එක්ව යම් ක්‍රමවේදයක් සැකසීමට කටයුතු කරනු ලැබේ.

(ආ) ණයගැති පාලනය

බොල්ණය වෙන්කිරීමේ ප්‍රතිපත්තිය වනුයේ වර්ෂ 02 කට වැඩි ණය ප්‍රමාණය බොල්ණය ලෙස කපාහැරීමය. පාඨමාලාවන් සඳහා ඇතුලත්ව ඇති ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ගෙන් යම් කෙනෙකු පාඨමාලා ගාස්තු අඩක් ගෙවා පාඨමාලා කාලය තුල හැරගොස් ඇති අවස්ථාවන් වලදී ඉතිරි පාඨමාලා ගාස්තුව අයකරගත නොහැකි වන අතර එම මුදල බොල්ණය ලෙස වෙන් කෙරේ. මේ සම්බන්ධව ප්‍රතපිත්තිමය තීරණයක් ගෙන එය පාලක මණ්ඩලයේ අනුමැතිය ද ලබා ඇත.

ආයතනික දියුණුව සඳහා ගන්නා ලද මධ්‍ය කාලීන ක්‍රියා මාර්ග

ආයතනයේ ඉලක්ක හා පරමාර්ථ කරා ළඟා වීම සඳහා පහත සඳහන් මාතෘකා ඔස්සේ ආයතනික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.

1. **සේවා සැපයීමේ දියුණුව**

1.1 **පාඨමාලා**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය දැනට පවත්වා ගෙන යනු ලබන පාඨමාලා එලෙසින්ම පහත සඳහන් ප්‍රධාන මාතෘකා යටතේ පවත්වා ගෙන යෑම.



විවිධ වෘත්තීය මාර්ග ඔස්සේ මෙම පාඨමාලා සංවර්ධනය කර ඇත. සියලු පාඨමාලා වසර 3 ක්ට වරක් හෝ අවශ්‍ය අවස්ථාවලදී සංශෝධනය කරනු ලැබේ.

1.2 **සම්මන්ත්‍රණ සහ වැඩමුළු**

පාසැල් හැරගිය සිසුන් සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වා ඒ ආශ්‍රයෙන් ක්ෂේත්‍රයේ වෘත්තීය සංවර්ධනයට මාර්ගෝපදේශ සපයනු ලැබේ.

තාක්ෂණික වැඩමුළු පවත්වා ක්ෂේත්‍රයේ නියැලි සේවක මහතුන්ට නව තාක්ෂණය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දේ. මේ තුළින් ඔවුන් සතු කුසලතා සහ නුවණ වර්ධනය කෙරේ.

1.3 **විශේෂ පුහුණු වැඩසටහන්**

රජයේ සහ පෞද්ගලික ආයතන වල ඉල්ලීම අනුව ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය මුද්‍රණ ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයට අදාල පාඨමාලා අලලා විශේෂ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

1.4 **මුද්‍රණ ක්ෂේත්‍රය නැංවීම**

නව තාක්ෂණයට අනුව සීඝ්‍රයෙන් දියුණුවන මුද්‍රණ තාක්ෂණයට සරිලන ලෙස යන්ත්‍රෝපකරණ සහ මනුෂ්‍ය සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාල පාඨමාලා සම්මන්ත්‍රණ, සංදර්ශන සහ වැඩමුළු වලට ආයතනය මෙන්ම සේවක මහතුන් ද සහභාගී කරවීම.

2. **ආයතනික සේවාවන් ප්‍රසිද්ධ කිරීම සහ සංවර්ධනය**

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සේවාවන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලට දැනුවත් කිරීම සඳහා අලෙවි උපදේශකයෙකු පත් කිරීම.

ශ්‍රී ලංකාවේ මුද්‍රණ ආයතන සේවාවන් පිළිබඳ පුවත්පත් වාර්තා පල කිරීම සහ රූපවාහිනී ආයතනය සමඟ සාකච්ඡා පැවැත්වීම තුලින් දිවයිනේ සිසුන්ට ආයතනය පිළිබඳ දැනුවත් කිරීම. රජයේ ගැසට් නිවේදන ආධාරයෙන් පාඨමාලා ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.

නව තාක්ෂණික පහසුකම් සහිත වෙබ් අඩවියක් නිර්මාණය කර ඒ හරහා තොරතුරු සැපයීම හා දත්ත ලබාගැනීම.

ආයතනික ප්‍රචාරණය උදෙසා facebook තාක්ෂණය යෙදවීම

ISO 9001 : 2008 ඵලදායී සහතිකය ලබා ගැනීම.

3. ආයතනික ප්‍රවර්ධනය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පුහුණුවන ශිෂ්‍යයන්ට නව තාක්ෂණික දැනුම ලබාදීම සඳහා වර්ණ 4 න් යුත් නව මාදිලියේ මුද්‍රණ යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා ව්‍යාපෘති වාර්තාවක් අමාත්‍යාංශය වෙත භාර දී ඇති අතර ඒ පිළිබඳව දැනට අමාත්‍යාංශයේ සාකච්ඡා සිදු වෙමින් පවතී.

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ආධාර ඇතිව බොරැල්ලේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට යාබදව පර්චස් 40ක ඉඩමක් අත්පත් කරගෙන ඇත. මෙම නව ගොඩනැගිල්ල ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ධාරිතාව වැඩි කිරීම සඳහා ආධාර වන අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට වඩාත් හොඳ පහසුකම් ලබාදීමටද අවස්ථාව උදා කර දේ. මෙම ඉදිකිරීම උදෙසා රජයෙන් ආධාර බලාපොරොත්තු වන අතර ඒ සඳහා අවශ්‍ය දත්ත සහ තොරතුරු අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇත.